# පත් කිරීමේ අධිකාර පත්‍රය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ කටයුතු භාර අමාත්‍ය ගාමිණී ලක්ෂ්මන් පීරිස් වන මා, ඔස්ට්‍රියාවේ සැල්ස්බර්ග් හි වෙළහෙළදාම් කරන, සංචාරය කරන සහ වෙසෙන ශ්‍රී ලාංකික ජාතිකයිනට සියලු නීත්‍යානුකූල මාර්ගවලින් උදව් උපකාර කිරීම හා ආරක්ෂා කිරීම සඳහා පූර්ණ බලය සහ අධිකාරිත්වය සහිතව ශ්‍රී ලංකාව වෙනුවෙන් පෙනී සිටින ඔස්ට්‍රියාවේ සැල්ස්බර්ග් හි නේවාසික නිර්වේතනික කොන්සල්වරයා ලෙස ගර්හාඩ් හියුබර් මහතා (Mr. Gerhard Huber) මෙයින් සංස්ථාපිත කර පත් කළ බව සියලු දෙනාම දැන ගනිත්වා.

සිය රාජකාරි ඉටු කිරීමෙහිලා ඔහුට අවශ්‍ය විය හැකි සහාය, භක්ත්‍යාදරයෙන් සහ විශ්වාසයෙන් ලබාදෙන ලෙසත්, අන්‍ය මිත්‍ර රාජ්‍යවල නිර්වේතනික කොන්සල්වරුන්ට හිමි අයිතිවාසිකම් සහ අනුග්‍රහ ඔහුටත් ලබාදෙන ලෙසත් අදාළ සියලු බලධාරීන් වෙත සුහද මිත්‍ර ලීලාවෙන් ආයාචනා කරමි.

මෙම පත්වීම මෙම අධිකාර පත්‍රයේ සඳහන් දින සිට අවුරුදු පහක (05) කාල සීමාවකට වලංගු වේ.

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් පන්සිය පනස් හයක් වූ පොසොන් මස අව දසවක නම් තිථිය ලත් ගුරු දින (ක්‍රිස්තු වර්ෂ දෙදහස් දොළහක් වූ ජූනි මස දා හතර වැනි බ්‍රහස්පතින්දා) වන මෙදින කොළඹ දී මාගේ නිල මුද්‍රාව තබා අත්සන් කරන ලදී.

මහාචාර්ය ගාමිණී ලක්ෂ්මන් පීරිස්, පා.ම.
විදේශ කටයුතු භාර අමාත්‍ය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය